සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## නාට්‍ය හා රංගකලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් පද්‍ය, සංවාද, ගීත ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A "මල්ලියේ ඔහොම නොකරන් අපෙ අම්මාට
දෙතනේ කිරි දුන්නේත් අපි දෙන්නාට
තියෙන දෙයක් දෙන්නෙත් අපි දෙන්නාට
බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට"

B කුමටද සොබනියෙ කඳුළු සලන්නේ හේතුව මම නොදනිම්.......

C "ඔබ වහන්සේගේ ගෙල කපල මරන්න කිවේ ඔබ වහන්සේගේ මලනුවන්මයි"

D තැන තැන රවුමට ඉඳගෙන
ඉදහිට එබිකම් කර කර
ලේන්සු හංගන්න ළමයි
එක්රොක් වෙන්නා...

E "මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත් ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත"

01) A අක්ෂරයේ සඳහන් පද්‍ය නිර්මාණය

1. නාට්‍ය ගීතයකි 2. ජන කවියකි 3. සරල ගීතයකි 4. ළමා ගීතයකි

02) B අක්ෂරයේ කියවෙන නාට්‍ය ගීතය ......................... අයත් වේ.

1. මනමේ නාට්‍යට 2. සිංහබාහු නාට්‍යට 3. නරි බෑනා නාට්‍යට 4. කදාවළලු නාට්‍යට

03) C අක්ෂරයෙන් කියවෙන සංවාද කොටස අයත් ජනකතාව වනුයේ,

1. ගමරාල දිව්‍ය ලෝකේ ගියා වගේ 2. පරංගියා කෝට්ටේ ගියා වගේ
3. අබරන් සිල් ගත්තා වගේ 4. අනුන්ට කැපූ වළේ තමන් වැටීම

04) D අක්ෂරයේ සඳහන් පද්‍ය........................අයත් වේ.

1. ජන ක්‍රීඩාවකට 2. ජන කතාවකට 3. නාට්‍යකට 4. සාමාන්‍ය ක්‍රීඩාවකට

05) E අක්ෂරයේ සඳහන් කවිය ඇතුලත් ග්‍රන්ථය වනුයේ,

1. සිරිත් මල්දම 2. ලෝ වැඩ සඟරාව 3. ධම්ම පදය 4. මහාවංශය

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06) ශෝකය නැමති හැඟීම ප්‍රකාශ කිරීමට උපකාරී වන අභිනය වනුයේ,

1. ආංගික අභිනය 2. සාත්ත්වික අභිනය 3. වාචික අභිනය 4. ආහාර්ය අභිනය

07) නාට්‍ය පිටපතක් ලිවීමේදී වරහන් තුළ ලිය වී ඇත්තේ,

1. චරිත 2. සංවාද 3. රංග විධාන 4. ගීත

08) පහත නිර්මාණ අතුරින් ළමා නාට්‍ය නිර්මාණයක් වනුයේ,

1. කදාවළලු 2. සිංහබාහු 3. නරිබෑනා 4. තොප්පි වෙළෙන්දා

09) යමෙකු කරන දේ ඒ අයුරින් නිර්මාණය කිරීම,

1. ක්ෂණික නිරූපන 2. භූමිකා නිරූපන 3. අනුකරණය 4. සමාරෝපණය

10) නළුවාගේ බාහිර සමාරෝපනයට අයත් අනුශාංගික කලාවකි

1. චරිත 2. පිටපත 3. පෙළ මතක්කරන්නන් 4. රංග වස්ත්‍රාභරණ

- **හිස්තැනට සුදුසු පදය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

11) කතන්දරය අසා රස විදිය හැකි අතර අසන්නා ...................................... ලෙස හඳුන්වයි.

12) ස්වාභාවික පරිසරය නිරීක්ෂණය කිරීමෙන් ...................................... සිදු කල හැකිය.

13) නාට්‍ය යනු ...................................... කලාවකි.

14) එක් එක් පුද්ගල චරිත තුළ ...................................... රාශියක් ඇත.

15) සත්ව චර්යාවන් ඇසුරු කර ගනිමින් ...................................... ඉදිරිපත් කළහැකිය

(නිර්මාණය / භූමිකාව / ශ්‍රාවකයා / ප්‍රේක්ෂකයා / ක්ෂණික නිරූපන / සාමූහික)

- පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදිනම් (✗) ලකුණද යොදන්න.

16) රංග අභ්‍යාස අවශ්‍ය වන්නේ අධ්‍යක්ෂවරයාටය. ( )

17) ප්‍රබල සංවාද නාට්‍යයකට අත්‍යවශ්‍ය නොවේ. ( )

18) රකුසෙක් සහ සුරංගනාවෝ මානුෂීය චරිත නොවේ. ( )

19) කටහඬ සංවර්ධනයට හඬ අභ්‍යාස උපකාරී වේ. ( )

20) නව නිර්මාණයක් බිහි කිරීමට පරිකල්පනය අවශ්‍ය නොවේ . ( )

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.

- පහත සංවාදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පලවන මීයා : අහල නැද්ද එහා ගමේ - කුකුළුහාමිගේ විස්තර
අසරණ අපි වගේ අයට - උදව් දෙන්න හරි කැමතිලු

සියල්ලෝම : එහෙනං අපි එහාට යමු - ගිහිං කුකුළුහාමි සොයමු
යමක් කමක් කරලා දීලා - ඉන්ට කන්ට සොයා ගනිමු

(පිරිස ගායනා කරති. මීයෝ අභිරූපණය කරති)

නියර දිගේ - දුවගෙන ගොස්
ඒ දණ්ඩෙන් - එගොඩ වෙලා
කඳු නැගලා කඩුලු පැනලා - මී හාමිලා හතර දෙනා
කුකුළුහාමි - සොයා යතෙයි
අන්න අතන තියන - ගෙදර වෙන්ටැ කුකුළුහාමි ඉන්නෙ

(සියල්ලො ම කුකුළුහාමිගේ ගේ දෙස එබී බලා)
දොර නම් වසා ඇත - ගෙයින් පිට ගොස් වත් ද?
(කුකුළුහාමි එළියට එයි.)

මලක් : එච්චර කරදර මොකට ද? - කුකුළුහාමි අර ඉන්නේ
ගොහින් කතා කර බලන්න.
(කුකුළුහාමි වට පිට බලයි)

01) 1. ඉහත සංවාදය අයත් නාට්‍ය කුමක් ද?
2. මෙම සංවාදය අයත් නාට්‍යයේ නිර්මාණකරු නම් කරන්න.
3. මෙහි එන රංග විධානයක් ලියන්න.
4. මෙම සංවාදයේ සිටින චරිත 3 ක් ලියන්න.
5. මෙම නාට්‍ය තුලින් ලබාදෙන ආදර්ශ 3 ක් ලියන්න. (ල. 2 X 5 )

02) 1. ඔබ පන්ති කාමරේ දී ඉගෙනගත් අනුශාංගික අංග 2 ක් නම් කරන්න. (ල. 02)
2. ඔබ නිර්මාණය කල අනුශාංගික අංගයක් නම්කර ඒ සඳහා යොදාගත් අමුද්‍රව්‍ය 4 ක් ලියන්න. (ල. 04)
3. අනුශාංගික අංග නිර්මාණයේදී ඔබ සැලකිලිමත් වූ කරුණු 4 ක් ලියන්න. (ල. 04)

03) 1. පන්ති කාමරයේ ඔබ ඉගෙන ගත් ජන කථා 3 ක් නම් කරන්න. (ල. 03)
2. ජන කතාවක ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)
3. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ජන කතා වර්ග කල හැකි අතර එවැනි ක්ෂේත්‍ර 4 ක් ලියන්න. (ල. 04)

04) 1. අනුකරණය යනු කුමක්ද? කෙටියෙන් ලියන්න. (ල. 02)
2. ඔබ පන්තියේදී අනුකරණය කල චරිතයකට සුදුසු ඇඳුමක් ඇද චරිතය නම් කරන්න. (ල. 04)
3. පහත සඳහන් චරිත වර්ගීකරණය කරන්න.
(ගොවියා, කොටියා, දෙවියා, ගුරුතුමා, පොලිස් නිලධාරියා, වලහා, සුරන්ගනාවී, රිලවා, රකුසා, බූතයා, රියදුරා, හාවා, නළුවා) (ල. 04)

05) 1. අභිනය යනු කුමක්ද? කෙටියෙන් ලියන්න. (ල 02)

2. සතර අභිනය නම් කරන්න. (ල 04)

3. ඔබ නම්කළ අභිනයන්ගෙන් අභින 2 ක ලක්ෂණ තුන බැගින් ලියන්න. (ල 04)